www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*ඉරාක යුද්ධය සිව් වන වසරට එලඹෙන විට:*

# සියලු එක්සත් ජනපද හමුදා වහා ම ඉවත් කිරීම සඳහා

**As Iraq war enters fourth year**
**For the immediate withdrawal of all US troops**

**ලෝසවෙඅ කර්තෘ මන්ඩලය විසිනි**
**2006 මාර්තු 18**

*මෙම පත්‍රිකාව ඉරාකයේ ඇමරිකානු යුද්ධයේ තෙවස් සැමරුමට විරෝධය දැක්වීමට මාර්තු 18 වන සෙනසුරාදාට සංවිධානය කර ඇති පෙලපාලිවල බෙදා හැරීම පිනිස ය.*

ඉරාක යුද්ධය සිව් වන වසරට එලඹෙන විට, ඇමරිකානු මිලිටරි වාවිලෑමට ඇති විරුද්ධත්වය කිසි දිනෙක මේ සා පරිමානයක් ගෙන නො තිබුනි. ඇමරිකානු ජනතාවගේ පැහැදිලි හා එන්ටඑන්ට ම වැඩි වන බහුතරයක් මිලියන 26ක් වන ඉරාක ජනතාව එක්සත් ජනපද සංගත ප්‍රභූවේ උවමනාවන්ට යටත් කර ගැනීමේ ලේ වැකි ප්‍රයත්නයට විරුද්ධත්වය ප්‍රකාශ කරයි.

ඉරාක භූමියේ සිටින ඇමරිකානු භටයන් -- යුද්ධය පවත්වා ගෙන යාම යුක්තිසහගත කිරීමට සහයෝගය ලැබිය යුත්තේ මොවුන් සඳහා ය යි කෙලවරක් නැතිව කියා සිටින -- අතර මෑතක දී පැවැත්වූ මත විමසුමක දී සියයට 72ක් දෙනා සියලු ඇමරිකානු හමුදා වසරක් තුල සම්පූර්නයෙන් ම ඉවත් කිරීම අනුමත කල අතර ඉන් අඩකටත් වඩා ඇමරිකාව හය මසකට නොවැඩි කාලයක් ඇතුලත ඉවත් විය යුතු ය යි පවසන බව පෙන්නුම් කලහ.

මහජන මතයේ මෙම දැවැන්ත වෙනස් වීම ඇති වූයේ ජනමාධ්‍යවලින් වත් බුෂ් පරිපාලනයේ ව්‍යාජ දේශපාලන විරුද්ධවාදීන් වන ඩිමොක්‍රැටික් පක්ෂයෙන් වත් කිසිදු බැරෑරුම් විරුද්ධත්වයක් හෝ යුද්ධය පිලිබඳව විවේචනාත්මක විශ්ලේෂනයක් පවා හෝ නොමැති වීම තිබිය දී ය. සැබවින් ම, මිලියන ගනනක් ඇමරිකානු වැඩ කරන ජනතාව තමන්ගේ ම නිගමනවලට එලඹියේ, හතු පිපෙන්නාක් සේ පැන නගින ත්‍රස්තවාදයට එරෙහි එක ම පිලිතුර, බාධාවකින් තොර ඇමරිකානු මිලිටරිවාදය ලෙස පෙන්වා දෙමින් මහජනතාව සන්ත්‍රාසයට පත් කිරීම අරමුනු කොට ගත් රුදුරු ප්‍රචාරක ව්‍යාපාරයක දත්වලට සිර වී සිටින අතරතුර ය.

කෙසේ වෙතත්, ආන්ඩුවේ ප්‍රචාර හෝ මාධ්‍ය විකෘත කිරීම් කෙතරම් යෙදුවත් මුසාවන්ගේ පදනම මතින් ආරම්භ කල මෙම සාපරාධී ව්‍යවසාය වපුරා ඇත්තේ ඒකාන්ත ව්‍යසනයක් බව සැඟවිය නොහැකි ය. වසර තුනකට පෙර ''කම්පනයේ හා භීතියේ'' බෝම්බ හෙලීම්වල සිට දැන් දිනපතා සිදු වන සමූලඝාතන දක්වා වූ ඇමරිකානු ආක්‍රමනය ඉරාක ජනතාවට ඇති කලේ ඓතිහාසික ඛේදවාචකයකි.

ඝාතනයට ලක් වූ ඉරාක පිරිමින්, ගැහැනුන් හා ලමයින්ගේ සිරුරු කිසිවකු විසින් ගනන් කර නැති නමුත් ඇමරිකානු මැදිහත් වීම සිදු වූ දා සිට කල ඝාතනයන් දැන් ලක්ෂ ගනනක්ව තිබේ.

මීට අමතරව 2,300ක් ඇමරිකානු සොල්දාදුවන්ගේ -- මින් වැඩි දෙනා කම්කරු පන්තියෙන් හා දුගී ජන කොටස් අතරින් බඳවා ගත් අය යි -- ජීවිත කැප කර ඇත්තේ ද තවත් දසදහස් ගනනක් ශාරීරික හා මානසික ආබාධවලට ලක් කර ඇත්තේ ද නින්දිත විජිතවාදී මාදිලියේ යුද්ධයකට සහභාගි වීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

මිලිටරි යටත් කිරීම දිගට ඇදී යද්දී සිදුව ඇත්තේ ඇමරිකානු මිලිටරි ක්‍රියාන්විතයන්ගේ සහ ඇමරිකානු යුද්ධයෙන් නිර්මිත සමාජ බිඳ වැටීමෙන් කුපිත කරවූ වාර්ගික ප්‍රචන්ඩත්වයේ මනුෂ්‍ය සංහාරය තීව්‍ර වීම පමනි. පෙන්ටගනයේ මුදලින් නඩත්තු කරන හා පුහුනු කල ඉරාක පොලිස්-මිලිටරි ඝාතක කන්ඩායම්වල වධබන්ධනයේ හා ඝාතනයේ ගොදුරු වූ වෙඩි වැදුන හෝ ගෙල සිර කෙරුන සිරුරු බැග්ඩෑඩ් මෘත ශරීරාගාරවල ගොඩ ගැසේ.

සමාරා අසබඩ ගම්මානවලට කඩා වැදී ප්‍රහාරක ගුවන් යානාවල බෝම්බ හෙළීම් මධ්‍යයේ ගෙන් ගෙට පරීක්ෂාවේ යෙදෙන ඒකාබද්ධ ඇමරිකානු හා ඉරාක හමුදාවන් යොදා ගනිමින් ගෙන යන ඇමරිකානු මිලිටරියේ අලුත් ම "පීරන්නා" නම් ක්‍රියාන්විතය, බුෂ් පරිපාලනය හා පෙන්ටගනය අනුගමනය කරන මූලෝපාය පිලිබඳව තර්ජනාත්මක අනතුරු ඇඟවීමකි. මුලුමනින් ම පාහේ ෂියාවරුන්ගෙන් සමන්විත ඉරාක හමුදා, ලේ ගංගාවක් නිර්මානය කලා වූ ස්වර්නමය පල්ලියට බෝම්බ දැමීම සිදු වූ නගරය අසල ම සුන්නි ජන කේන්ද්‍රස්ථානවලට එරෙහිව යොදවා තිබේ. මෙය, එක්සත් ජනපද යටත් කිරීමට එරෙහි විරෝධතාව අවසන් නොවන්නේ නම් වොෂින්ටනය වාර්ගික ජනඝාතනයේ යුද්ධයක් මුදා හැරීමට සූදානම් බවට කෙරෙන පැහැදිලි තර්ජනයකි.

එක්සත් ජනපද හමුදා විද්‍යාලයේ ස්ටීවන් බිඩ්ල් විසින් *ෆොරීන් එෆෙයාර්ස්* සඟරාවේ අලුත් කලාපයට මෙම මූලෝපාය පැහැදිලි කර තිබේ: ''එක්සත් ජනපදය සුන්නි, ෂියා හා කුර්ද්වරුන් අතර මිලිටරි බලතුලනය වෙනස් කිරීමට තර්ජනය කල යුතු ය. ඒ ඔවුන් සාකච්ඡාවට බලාත්කාරයෙන් කැමති කරවා ගැනීම පිනිස ය. වොෂින්ටනය සුන්නිවරුන්ට සාකච්ඡා මේසයට පැමිනීමට බල කරනු වස් එක්සත් ජනපදය විසින් පුහුනු කල හා සහාය දෙනු ලබන ෂියා-කුර්ද් භට හමුදාවල වාසිය භාවිත කල යුතු ය.''

මෙම විධික්‍රමයන් දැනට මත් යොදා ගෙන තිබෙන බවට සියලු ඇඟවීම් පවතී. යුද්ධය වෙනුවෙන් පෙනී සිටින අය, ලේ ස්නානයක අන්තරායෙන් තොරව ඇමරිකාවට ඉවත් විය නොහැකි බව අවධාරනය කරන අතර, ඉරාකයේ සිය ග්‍රහනය පවත්වා ගෙන යාමේ මංමුලාසහගත උත්සාහය තුල වොෂින්ටනය එවන් ලේ ගංගාවක් හිතාමතා ම ආරම්භ කර තිබේ.

වසර තුනකට පෙර ඇමරිකානු ආක්‍රමනය සඳහා දුන් සියලු හේතුකාරනා -- නොපවතින ජනසංහාරක අවි සහ ගොතන ලද ත්‍රස්තවාදී සබඳතා -- දිගු කලකට ඉහත දී ම බොරු බව එලිදරව් වී තිබේ. දැන් බුෂ් පරිපාලනය මෙම යුද්ධය ''නිදහස'' හා ''ප්‍රජාතන්ත්‍රවාදය'' සඳහා අරගලයක් ලෙස හැඳින්වීම නිසැක ලෙසින් ම සියල්ල අතුරින් නීච ම බොරුව ය.

යුද්ධය නිදහස පිලිබඳව නො ව වහල් භාවය උදෙසා ය. එය දියත් කරනු ලැබුවේ ලෝක වෙලඳ පොල තුල ඇමරිකානු ධනවාදයේ පහල වැටෙන අපේක්ෂාවන් දල්වා ලනු පිනිස ලොව දෙවන විශාලතම තෙල් නිධිවල පාලනය ඩැහැ ගැනීම සහ යුරෝපයේ සහ ආසියාවේ සිය ප්‍රතිමල්ලවයන්ට එරෙහිව ගෝලීය ආධිපත්‍යය සඳහා වන ඇමරිකානු ප්‍රයත්නය තව දුර ගෙන යාම එල්ල කර ගත් දිග්විජයේ සහ මංකොල්ලයේ ක්‍රියාවක් ලෙස ය.

එය වධහිංසා පැමිනවීමේ සිට නීති විරෝධී රඳවා ගැනීම් හා ආන්ඩුවේ රහස් ඔත්තු බැලීම් දක්වා වන ඇමරිකාවේ ද ලොව පුරා ම ද ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පෙර නුවූ විරූ ප්‍රහාර එල්ල කිරීමක් සමග එකට බැඳුනේ ය. එසේ ම ඉරාකය තුල ප්‍රජාතන්ත්‍රවාදය පමනක් නො ව ඝාතක කන්ඩායම් සහ වධ දීමේ මධ්‍යස්ථාන හැරුනු කල නියමාකාර ආන්ඩුවක් වත් නො පවතී.

ඉරාකයේ ඇමරිකානු මැදිහත් වීම යෝධ නිෂ්ඵල ව්‍යායාමයක් බව බුෂ් පරිපාලනයේ දක්ෂිනාංශික යාවජීව ආධාරකරුවෝ වැඩි සංඛ්‍යාවක් පවා දැන් විවෘතව පිලිගනිති. කෙසේ වෙතත්, මින් අදහස් වනුයේ ඇමරිකානු පාලක ප්‍රභූ පැලැන්තිය සිය ගමන් මග අලුත් කර ගනු ඇතැයි කියා සහ ලෝක කරලිය මත සිය අභිමතය පැටවීම උදෙසා අනාගතයේ දී මිලිටරි බලය යෙදීමෙන් වැලකී සිටිනු ඇතැයි කියා කිසිවකු මොහොතකට වත් විශ්වාස නො කල යුතු ය.

මීට ප්‍රතිවිරුද්ධව බුෂ් පරිපාලනය මේ සතියේ යුද ආක්‍රමනකාරිත්වයේ "පූර්වභංග" ධර්මතාව -- එනම් කුපිත කිරීමකින් තොර -- යලි තහවුරු කරමින් සහ ඉරානය දැනට මත් -- යලිදු වතාවක් න්‍යෂ්ටික අවි සහ ත්‍රස්තවාදී සබඳතා පිලිබඳ තහවුරු නොකල ප්‍රකාශවලින් -- ඉලක්ක කර ගෙන සිටින බව පැහැදිලි කරමින් නව ජාතික ආරක්ෂක මූලෝපායික ලියවිල්ල එලි දැක්වීමත් සමග නව හා වඩාත් බලගතු යුද්ධ සූදානම් කෙරෙමින් තිබෙන බව ඇඟවුම් කෙරෙයි.

යුද්ධය කරා දිවීම, ධනපති පද්ධතියේ ප්‍රගාඪ අර්බුදයෙහි තියුනු ම ප්‍රකාශනය අත් කර ගන්නා සමාජ අසමානතාව නො කඩවා වැඩී යාමේ ඍජු ප්‍රතිඵලයකි. ඉරාක යුද්ධය සහ මිලිටරිවාදයේ වර්ධනය, ලෝක වෙලඳ පොලවල් හා සම්පත්වල ආධිපත්‍යය දැරීමේ සිය එල්ලය තව දුරටත් පවත්වා ගනු වස් බලය යෙදීමට අදිටන් කර ගත් පාලක සුලුතරයේ උවමනාවන් පොදුවේ ප්‍රකාශයට පත් වීමකි. මෙම ප්‍රතිපත්තිය ගෙන යනු ලබන්නේ, සිය රැකියා, ජීවන තත්වයන් හා මූලික ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් මත නොනවතින ප්‍රහාරයන්ට මුහුන දී සිටින පලල් වැඩ කරන ජනතාවගේ වියදමෙනි.

ඉරාක යුද්ධය අවසන් කිරීමත් දැනට මත් වර්ධනය කර ඇති අනාගත යුද සැලසුම් පරාජය කිරීමත් 2006 කොන්ග්‍රස් ඡන්දයේ දී හෝ 2008 ධවල මන්දිර ඡන්දයේ දී ඩිමොක්‍රැටිකයන්ට සහාය දීමේ මැතිවරන මූලෝපායක් මත පදනම්ව අත් කර ගත නොහැකි ය. ඩිමොක්‍රැටික් පක්ෂය ඉරාකයට එරෙහි යුද්ධය පිලිබඳව පූර්න එකඟතාව පල කරන අතර එහි ප්‍රමුඛ දේශපාලන නලුවන්ගෙන් එන්ටඑන්ට ම වැඩි වන සංඛ්‍යාවක් ඇද ගනු ලබන පාලක මූල්‍ය අධිකාරය හා එහි අවශ්‍යතා ද ආරක්ෂා කරයි.

2006 මැතිවරනය ආසන්න වන විට ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වය, යුද්ධය නිමා කරන ලෙස ඇමරිකානු ජනතාවගේ පුලුල් පදනමක් සහිත ඉල්ලීමට දේශපාලන ප්‍රකාශනයක් දීමේ කිසිඳු අභිමතයක් තමන්ට නැති බව පැහැදිලිව පෙන්නුම් කරයි. මීට ප්‍රතිවිරුද්ධව ඔවුහු, බුෂ්ට දකුනින් පහර දීම සඳහා ඉරාන ප්‍රශ්නයේ සිට ඩුබායි වරාය ගනුදෙනු දක්වා ප්‍රශ්නවලින් කරුනු තෝරා ගත්හ.

පක්ෂයේ 2008 නාම යෝජනා සඳහා ඉදිරියෙන් ම සිටින්නේ යැයි සැලකෙන නිව් යෝක් සෙනෙට් සභික හිලරි ක්ලින්ටන් සමග වඩා ම සමීපව අනන්‍ය වන දේශපාලනික කල්ලිය වන ඩිමොක්‍රැටික් නායකත්ව කවුන්සිලය ඉරාක ගැටලුව පිලිබඳව නිකුත් කල මෑත ම ප්‍රකාශය සලකා බලන්නඃ

''විශ්වාසවන්ත භාවය පුබුදුවන නව නායකත්ව කන්ඩායමක් පිහිටුවීමට ද, තම වගකීම් ඉටු කිරීමේ දී නැවුම් ලෙස කටයුතු කරන ලෙසට ද අප ධවල මන්දිරයට බල කල යුතු ය.  සියල්ලට මත් වඩා ඩිමොක්‍රැටිකයන් මහජනතාවට පැහැදිලි කල යුත්තේ අප පෙනී සිටින්නේ ඉරාකය තුල ලබා ගන්නා ජයග්‍රහනය සඳහා මිස ඉක්මනින් ඉන් ඉවත් වීම සඳහා කෙරෙන ඉල්ලීම් වෙනුවෙන් නොවන බව යි.

ඩිමොක්‍රැටිකයන්ගේ සමහර කොටස් දැන් කතා කරන්නේ "මූලෝපායික යලි ස්ථානගත කිරීමේ" ප්‍රතිපත්තියක් ගැන ය. එයට අනිවාර්යයෙන් ම ඇතුලත් වන්නේ එක්සත් ජනපද හමුදා ඉරාක නගරවලින් ඉවත් කර, ඇමරිකානු ගුවන් හමුදා බලය ද ක්ෂනික විහිදුම් බලකායන් ද ඔවුන්ට සහාය පිනිස එක්සත් ජනපදය විසින් පුහුනු කල ඉරාක මිලිටරි හා පොලිස් බලය ද යොදා ගෙන ඉරාක ජනතාවට එරෙහිව යුද්ධය ගෙන යා යුතු බව යි.

උදාහරනයක් ලෙස, යුද විරෝධීන් වෙතින් ඩිමොක්‍රැටික් ප්‍රාථමික ඡන්ද විමසුම්වල දී විශාලතම සහාය ආකර්ෂනය කර ගත් 2004 දී එක් අපේක්ෂකයකු වූ පක්ෂ සභාපති හොවාඩ් ඩීන්ගේ ස්ථාවරය මෙය යි. පක්ෂය "අපේ හමුදා යලි යෙදවීම" පිනිස "නුවනට හුරු සැලැස්මක්" ඉදිරිපත් කරනවා පමනකි යැයි පසු ගිය මස දේශනයක දී ඔහු කියා සිටියේ ය. "අපි කැපී ඉවත් වන්නට හෝ දුවන්නට හදනවා නො වෙමු. ඒක නිකං රිපබ්ලිකන් ප්‍රචාරයක්"යනුවෙන් ඔහු තව දුරටත් ප්‍රකාශ කලේ ය.

යුද්ධයට, සමාජ අසමානතාවට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට පහර දීම තීව්‍ර කිරීමට එරෙහි අරගලය සඳහා ද්විපක්ෂ ක්‍රමයෙන් ස්වාධීන වීම ද, ජාත්‍යන්තර ඉදිරි දර්ශනයක් හා සමාජවාදී ක්‍රියා මාර්ගයක් මත පදනම් වූ වැඩ කරන ජනතාවගේ නව දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම ද අවශ්‍ය කෙරේ.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සහ සමාජවාදී සමානතා පක්ෂය සටන් වදින විකල්පය මෙය යි.  වහා ම හා කොන්දේසි විරහිතව සියලු ඇමරිකානු හමුදා ඉරාකයෙන් ඉවත් කිරීම සහ මෙම නීති විරෝධී ආක්‍රමනය දියත් කිරීමේ කුමන්ත්‍රනයට වගකිව යුතු සියල්ලන් ම යුද අපරාධ අධිකරනවල නඩු විභාගවලට ලක් කිරීම යන ඉල්ලීම්වලට සටන් කරමින් එක්සත් ජනපදයේ සසපය මේ වසරේ ඇමරිකානු මධ්‍ය කාල මැතිවරනයට අපේක්ෂකයන් ඉදිරිපත් කරන්නේ ය.

මෙම ඉල්ලීම්වලට එකඟ වන්නා වූ ද මිලිටරිවාදයට, සමාජ අසමානතාවට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට පහර දීමට එරෙහිව සටන් කිරීමට අවශ්‍ය වන්නා වූ ද සියලු දෙනාට ම සසපය හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හමු වන ලෙස අපි උදක් ම ඉල්ලා සිටිමු. අපගේ අපේක්ෂකයන් ඡන්ද පත්‍රිකාවට ඇතුලු කිරීමේ පෙත්සම් ව්‍යාපාරය සමග එක් වන්න, කම්කරු පන්තියේ හැකි තරම් පලල් ස්තරයන් තුල මේ ක්‍රියා මාර්ගය වෙනුවෙන් සටන් කරන්න.

© www.wsws.org